# ක්‍රියාකාරකම් පත්‍රිකාව

1) හිස්තැනට ගැලපෙන වචනය තෝරා ලියන්න

1. වාණිජ බැංකුවක් සිය ජංගම ගිණුම් හිමියන්ට ගිණුමේ තොරතුරු සඳහන්කර එවනු ලබන වාර්තාව..........................යි(බැංකු අණකරය/ බැංකු ප්‍රකාශය/බැංකු තැන්පතු පත්‍රිකාව)
2. බැංකුව ව්‍යාපාරය වෙනුවෙන් පවත්වාගෙන යන ජංගම ගිණුමේ ගනුදෙනු වාර්තා තබනුයේ ........................... වලට අදාල ද්විත්ව සටහන් මූලධර්මයට වේ.(වත්කම්/ ආදායම්/ වගකීම්)
3. ව්‍යාපාරය තම මුදල් පොතේ බැංකු ගනුදෙනු වාර්තා කරනු ලබන්නේ ...................... වලට අදාල ද්විත්ව සටහන් මූලධර්මයට වේ.(වියදම්/ වත්කම්/ හිමිකම්)
4. ව්‍යාපාරයේ බැංකු ගිණුමට ...................... කරන අයිතම බැංකුව විසින් ව්‍යාපාරයේ ජංගම ගිණුමට බැර කරනු ලැබේ. (හර/ බැර/ අඩු)
5. ව්‍යාපාරයේ ජංගම ගිණුමට වෙනත් පාර්ශව විසින් සෘජුවම එවනු ලබන චෙක්පත් ...................... ලෙස හඳුන්වයි(ධාරක චෙක්පත්/ සෘජු ප්‍රේෂණ/ බැංකු අණකර)
6. බැංකු ගාස්තු සඳහා නිදසුනක් ලෙස ........................ ගත හැකිය. (චෙක්පොත් ගාස්තු/ කඩකුලී/ රක්ෂණ වාරික)
7. බැංකු ණය වාරික, රක්ෂණ වාරික, කල්බදු වාරික ආදිය ............................... සඳහා නිදසුන් ලෙස දැක්විය හැක.(ස්ථාවර නියෝග/ ස්ථාවර ගෙවීම්/ සෘජු ගෙවීම්)
8. ව්‍යාපාරය විසින් බැංකුවේ තැන්පත්කල නමුත්, එම කාලසීමාව තුල බැංකුව විසින් ව්‍යාපාරයේ ජංගම ගිණුමට එකතු නොකළ චෙක්පත් ......................................... චෙක්පත් ලෙස හැඳින්වේ.(නිකුත්කළ/ උපලබ්දි නොවූ/ අගරු වූ)හි
9. බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය ඇසුරින් ව්‍යාපාරයේ ........................................... පිළියල කරයි.(මුදල් ගිණුම/ බැංකු ප්‍රකාශය/බැංකු සැසඳුම් ප්‍රකාශය)
10. චෙක්පතක සඳහන් වටිනාකම බැංකුවේ පවතින ජංගම ගිණුමේ වටිනාකමට එකතුවීම චෙක්පතක් ............................... වීම ලෙස හැඳින්වේ.(උපලබ්දි/ නිෂ්කාශනය/ ප්‍රතිග්‍රහණය)

2) යා කරන්න

| | |
|---|---|
| 1. බැංකු ගිණුමේ හර පැත්තේ දක්නට ලැබෙන අයිතමයකි | 1 බැංකු ශේෂවල නිවැරදිබව තහවුරු කිරීමට |
| 2. බැංකු ප්‍රකාශයේ බැර තීරුවේ දක්නට ලැබෙන අයිතමයකට නිදසුනකි | 2 බැංකු ණය වාරික |
| 3. බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියල කිරීමේ අරමුණකි | 3 චෙක් තැන්පත් කිරීම් |
| 4. ස්ථාවර නියෝග සඳහා නිදසුනකි | 4 නිකුත්කළ චෙක්පත් වටිනාකම |
| 5. බැංකු ගිණුමේ බැර පැත්තේ දක්නට ලැබෙන අයිතමයකි | 5 ණයගැති ප්‍රේෂණ |

3) 2014 දෙසැම්බර් 31 දින දිනුකගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු: 12500/= ක් විය. එදිනට බැංකු ප්‍රකාශයේ ශේෂය බැංකු ගිණුමේ ශේෂයට වඩා වෙනස් විය. වෙනසට හේතු පහත දැක්වේ.

- බැංකු ජංගම ගිණුමට හර වූ නමුත් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් නොවූ බැංකු ගාස්තු රු: 200/= කි.
- අශෝක් සමාගමෙන් ලැබූ රු: 5000/=ක ලාභාංශ ජංගම ගිණුමට බැරවී තිබීම.
- දෙසැම්බර් මාසය තුල තැන්පත්කල නමුත් උපලබ්දි නොවූ චෙක්පත් රු: 8000/=
- දෙසැම්බර් මාසයේ නිකුත්කළ නමුත් මුදල් ලබාගැනීමට බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් රු: 9500/=කි.

අවශ්‍ය වන්නේ,

a. 2014.12.31 දිනට බැංකු ගිණුම සංශෝධනය කරන්න
b. 2014.12.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය සකස්කර බැංකු ප්‍රකාශයේ පැවති ශේෂය සොයන්න